# 08 කඩදාසි මාධ්‍යයෙන් විසිතුරු නිර්මාණ

විවිධ අලංකාර නිර්මාණ අතර පේපර් කුවිලින් කලාවට සුවිශේෂී තැනක් හිමිව ඇත්තේ, එහි ඇති සියුම් කලාත්මක බව නිසා ය. පේපර් කුවිලින් ක්‍රමයට සැකසූ නිර්මාණ අතර බහුල ව භාවිත කෙරෙන නිර්මාණ ලෙස සුභ පැතුම්පත්, ආරාධනාපත්, හා බිත්ති සැරසිලි සඳහන් කළ හැකි ය. නිර්මාණශිලි ව මෙවැනි දෙයක් අප විසින් ම, නිර්මාණය කර ගැනීම තුළින් විවේකය අර්ථවත් ව ගත කිරීමට සහ ආර්ථික වාසි සලසා ගැනීමට ද හැකි වනු ඇත.

පේපර් කුවිලින් පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම පිණිස පහත සඳහන් රූපවල දැක්වෙන නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.



8.1 රූපය - පේපර් කුවිලින් නිර්මාණ

වර්ණ කඩදාසි පටි භාවිත කරමින් නිසි වර්ණ ගැළපුමකට අනුව එම නිර්මාණ කර ඇති බව ඔබට පැහැදිලි වන්නට ඇත. විවිධාකාර ලෙස පටි තීරු නවා කිසියම් අර්ථාන්විත මෝස්තරයන් ගොඩනැගීමට නිර්මාණකරුවා සමත් ව ඇති බව ද ඔබට වැටහෙන්නට ඇත. අදාළ උපකරණ මෙවලම් සහ අමු ද්‍රව්‍ය භාවිත කරමින් ඔබ තුළ ද එවැනි කුසලතා වර්ධනය කරවීම මෙම පරිච්ඡේදයෙන් අදහස් කරයි.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පේපර් කුවිලින් ක්‍රමයට අලංකාර නිර්මාණ කිරීම සඳහා අවශ්‍ය මෙවලම්, උපකරණ හා ද්‍රව්‍ය හඳුනා ගනිමු.


| අවශ්‍ය උපකරණ/මෙවලම් | ද්‍රව්‍ය |
|---|---|
| කඩදාසි විරූපණ යන්ත්‍රය (Shearing Meachine)<br>පැන්සලය<br>වානේ කෝදුව<br>සුමට කරන ලද ලෑලි කැබැල්ලක්/වීදුරු පුවරුවක්<br>කඩදාසි කපන පිහිය (Paper knife)<br>කඩදාසි කපන කතුර<br>දැති කපන කතුර<br>ටූලය/ටූත්පික්<br>ට්විසරය<br>සිදුරු සහිත රාමුව<br>ඉවතලන සංයුක්ත තැටි (CD) | වර්ණවත් ඡායා පිටපත් කඩදාසි ($A_4$ ප්‍රමාණය)<br>ගම්<br>ඝන කඩදාසි |

### පේපර් කුවිලින් නිර්මාණ කිරීමේ මූලික පියවර හඳුනා ගනිමු

01. කඩදාසි පටි තීරු කපා ගැනීම
02. කඩදසි පටි රෝල් කිරීම
03. අවශ්‍ය ප්‍රමාණවලට ලිහිල් කිරීම
04. රෝල්කරගත් පටි හැඩ ගැන්වීම
05. සමතලා මතුපිටක අලවා ගැනීම
06. සැකසූ නිර්මාණයට නිමාවක් ලබාදීම

#### • කඩදාසි පටි කපා ගැනීම

නිර්මාණ කිරීමට අපේක්ෂිත මෝස්තරයට අනුව පටි තීරුවල පළල තීරණය කළ යුතු ය. ඒ සඳහා සුමට කරන ලද ලෑලි කැබැල්ලක් හෝ වීදුරු පුවරුවක මතුපිට කඩදාසිය තබා ගන්න.




8.2 රූපය - කඩදාසි විරූපණ යන්ත්‍රය (Shearing Meachine)


වානේ රූලක් සහ පැන්සලක් භාවිත කර කඩදසි පටිවල පලල නිවැරදි ව සටහන් කර ගන්න. කඩදාසි කපන කතුරක් හෝ කඩදාසි කපන පිහියක් භාවිතයෙන් පටි කපා ගන්න. කඩදාසි පටි කපා ගැනීම සඳහා කඩදාසි විරූපණ යන්ත්‍ර (Shearing meachine) භාවිත කිරීම වර්තමානයේ බහුල ව දැකිය හැකි ය. 8.2 රූපයේ දැක්වෙනුයේ කඩදාසි විරූපණ යන්ත්‍රයකි. එහි දැක්වෙන පරිදි කඩදාසියේ කෙළවර යන්ත්‍රය තුළට ඇතුළු කර එහි ඇති හැඬලය සීරුවෙන් කරකැවීමෙන් ඒකාකාර පළලකින් යුත් පටි රාශියක් සුළු කාලයකදී කපාගත හැකි ය. එම යන්ත්‍රය භාවිතයෙන් කාලය සහ ශ්‍රමය පිරිමැසුන ද මෙවැනි එක් යන්ත්‍රයක් භාවිත කිරීමෙන් කපාගත හැකි වනුයේ එකම පළලකින් යුතු වූ පටි පමණ ය.

## ● කඩදසි පටි රෝල් කිරීම

කපාගත් පටි යොදා ගනිමින් විවිධ හැඩ නිර්මාණය කිරීමට අවශ්‍ය වන උපකරණ සහ මෙවලම් කිහිපයක් පහත සඳහන් පින්තූරවලින් ඔබට හඳුනාගත හැකි ය.



8.3 රූපය - කඩදාසි පටි රෝල් කර ගැනීමට භාවිතාකරන වූලය



8.4 රූපය - වූලය භාවිතයෙන් කඩදාසි පටි රෝල් කිරීම

කපාගත් පටි ක්‍රමවත් ව රෝල්කර ගැනීමට සරල ව සැකසූ වූලයක් භාවිත කළ හැකි ය. එවැනි වූලයක් ඔබට වෙළෙඳපොළෙන් පහසුවෙන් මිල දී ගත හැකි ය. මෙම වූලයේ කෙළවර හරි මැදින් 3mmක දිගට සිහින් පැල්මක් යොදා ඇත.

කපාගත් කඩදාසි පටියේ කෙළවර එම වූලයේ පැල්ම තුළට ඇතුළු කර එම කඩදාසි පටියට යටින් මාපටඇඟිල්ල හා මැදගිල්ල තබා වූලයේ කෙළවර මැදිකරගෙන කඩදාසි පටියේ මුදුන ඉහළ යාම මාපට ඇඟිල්ලෙන් පාලනය කරමින් වූලයේ මිට කරකවන්න. එසේ කරකැවීමෙන් වූලයේ මුදුන වටා කඩදාසි පටි පාලනයකින් යුතු ව රෝල්කර ගත හැකි ය. මෙම ක්‍රියාවලිය ඉහත සටහන නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි ව අවබෝධ කර ගන්න.

වූලය වෙනුවට යොදා ගත හැකි අනුයෝගී උපකරණයක් ලෙස ටූත්පික් (Tooth Pick) හඳුන්වාදිය හැකි ය.

## ● අවශ්‍ය ප්‍රමාණයට ලිහිල් කිරීම




8.5 රූපය - රෝල් කරගත් කඩදාසිවලට ලිහිල ලබා දීම

වූලයෙන් ඉවතට ගත් කඩදාසි රෝලය අවශ්‍ය ප්‍රමාණයට ලිහිල් වීමට ඉඩ දීම කළ යුතු ය. එක ම ප්‍රමාණයට ලිහිල් කර ගැනීමට විවිධ උපකරණ භාවිත කළ හැකි ය. ඒ සඳහා භාවිත කළ හැකි උපකරණ වෙළෙඳපොළෙන් මිල දී ගත හැකි වේ. 8.5 රූපයේ දැක්වෙන පරිදි එම උපකරණය සමතලා මතුපිටක තබා ගන්න. රෝල් කරගත් පටි තීරු තැටිවල සිදුරු තුළට දමා අවශ්‍ය ප්‍රමාණයට ලිහිල් කර ගන්න. ඉන්පසු පටියේ කෙළවර ටූත්පික් එකක ආධාරයෙන් ගම් ස්වල්පයක් ආලේප කර අලවා ගන්න.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.


එසේ අලවාගත් පටි ලිහිල් කර ගැනීමට භාවිත කළ හැකි විකල්ප උපකරණයක් ලෙස සංයුක්ත තැටි (CD) ද භාවිත කළ හැකි ය.

### • රොල් කරගත් පටි හැඩ ගැන්වීම




8.6 රූපය - ට්විසරය

සංයුක්ත තැටියට දැමූ කඩදාසි රෝල් අවශ්‍ය පමණට ලිහිල් වූ පසුව 8.6 රූපයෙන් දක්වෙන ට්විසරය භාවිත කර කැමති හැඩවලට හැඩ ගන්වා ගන්න. ට්විසර තුඩෙන් තද කිරීම මගින් කැමති හැඩයක් ලබාගත හැකි ය. එවැනි හැඩ ගැන්වීම් කිහිපයක් 8.7 රූපයෙන් පෙන්වා දී ඇත.




8.7 රූපය - පේපර් කුවිලින් නිර්මාණ සඳහා යොදාගත හැකි විවිධ හැඩ

### • සමතලා මතුපිටක අලවා ගැනීම



8.8 රූපය - සංයුක්ත තැටියක් මත කරනු ලබන පේපර් කුවිලින් නිර්මාණයක්

හැඩ ගන්වාගත් කඩාදාසි තීරු පටි සුමට මතුපිටක් මත විවිධ හැඩයන්ට අලවා ගැනීමෙන් අලංකාර නිර්මාණ සකසා ගත හැකි ය. ඉවතලන සංයුක්ත තැටියක් මත අලවා සකස් කර ගත් පේපර් කුවිලින් නිර්මාණයක් 8.8 රූපයෙන් ඔබට දකගත හැකි ය. විවිධ කාඩ්පත්, බිත්ති සැරසිලි යනාදිය පේපර් කුවිලින් ක්‍රමයට සකස් කර ගත හැකි ය. මීට අමතර ව ත්‍රිමාන රූප සකස් කිරීම ද පේපර් කුවිලින් ක්‍රමයේ තවත් ඉදිරි පියවරකි. පේපර් කුවිලින් නිර්මාණ පිළිබඳ මූලික දැනුම ලබාගත් ඔබට එවැනි නිර්මාණ කළ හැකි ද යි අත්හදා බලන්න.



8.9 රූපය - පේපර් කුවිලින් නිර්මාණ

- **සැකසූ නිර්මාණයට නිමාවක් ලබා දීම**

සැකසූ නිර්මාණයට අලංකාර නිමාවක් ලබාදීමට පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- ★ නිර්මාණයට සුදුසු වර්ණවත් පසුබිමක අලවා ගැනීම.
- ★ දාරවල තද වර්ණයේ පටි අලවා ගැනීම.
- ★ දාර අග දැති කතුරෙන් කැපීම හා අවුට් ලයිනර් යෙදීම.
- ★ ඔබ නිර්මාණය කරන්නේ කාඩ්පතක් නම් හැකිලීමට දිග හැරීමට හැකිවන සේ සැකසීම.
- ★ නිර්මාණවලට අලංකාරයක් ලබාදීම සඳහා වේලාගත් තුත්තිරි, වර්ණ ගැන් වූ වියළි ශාක පත්‍ර කෙඳි වර්ග යනාදිය එකතු කිරීම
- ★ බිත්ති සැරසිල්ලක් නම් එහි කල්පැවැත්ම සඳහා රාමුකර ගැනීම.

**සාරාංශය**

පේපර් කුවිලින් කිරීම කඩදාසි භාවිතයෙන් කළ හැකි අලංකාර විසිතුරු අත්කම් නිර්මාණයකි. වර්ණ ගැළපීම සහ ක්‍රමානුකූල ව වැඩ කිරීම තුළින් නිර්මාණවල අගය වැඩි දියුණු කළ හැකි ය. ඇස, අත සමායෝජනය තුළින් දරුවන් තුළ නිර්මාණ කුසලතා වැඩි දියුණු කළ හැකි ය. කාලීන අවශ්‍යතාවක් වන ආරාධනා පත්‍ර, සුබ පැතුම්පත් නිර්මාණය කිරීම මගින් ආර්ථික වාසි සැලසෙන අතර ආත්ම තෘප්තියක් ද ලබා ගත හැකි ය.

**ක්‍රියාකාරකම 8.1**

පේපර් කුවිලින් ක්‍රමය භාවිත කරමින් සුභපැතුම් පතක් නිර්මාණය කරන්න. එහිදී වර්ණ ගැළපීම සහ නිමාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන්න.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*